# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2199/15 - 2020 ඔක්තෝබර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන නිවේදන

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 289 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ වන මා විසින් සාදන ලද පහත සඳහන් නියෝග මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

රාජා කොල්ලුරේ,
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
කුරුණෑගල දී ය.

### නියෝග

1. මෙම නියෝග 2020 මහා නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 211 වන වගන්තිය සහ 214 වන වගන්තිය අනුව සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු, පිළිවෙළින් ඊළඟ වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම, සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම, අයවැය යෝජනාව සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම මෙම නියෝගවලින් නියම කර ඇති පටිපාටිය අනුව සිදු කළ යුතු ය. *නියෝගවල පටිපාටිය අනුගමනය කළ යුතු බව.*

1A - PG 5206 — 25 (2020/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ආදායම් හා වියදම් ඇස්තමේන්තු පිළිබඳ ප්‍රාරම්භක ක්‍රියා.**

3. ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීමට අවශ්‍ය ආදායම් ප්‍රභව හඳුනා ගැනීම, සභාව සතු වත්කම් මෙහෙයවීම සඳහා වැය ප්‍රතිපාදන පුරෝකථනය සහ වෙනත් පුනරාවර්තන වියදම් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම සඳහා ප්‍රාරම්භක වැඩපිළිවෙළ යෙදීම ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ සහ කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

**ආදායම් නියම කිරීමේ සහ යෝජනා සම්මත කිරීම සහ ආදායම් නියම කිරීමේ යෝජනා පිළිබඳ නිවේදන පළ කිරීම.**

4. (1) කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා විමසා, ඊළඟ වර්ෂය සඳහා සභාවට අය කර ගත යුතු හා අය කර ගත හැකි වරිපනම්, බදු, කුලී ආදායම් සහ සභාව විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අය කර ගත යුතු ගාස්තු නියම කිරීමේ සහ යෝජනා කෙටුම්පත් කර මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාවක් ද සමග, සැප්තැම්බර් මස 30 වන දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**සංවර්ධන යෝජනා කැඳවීම හා ප්‍රමුඛතාගත කිරීම.**

(2) සභාව විසින් සම්මත කරන ලද වරිපනම්, බදු, කුලී ආදායම් සහ ගාස්තු නියම කිරීමට අදාළ යෝජනා පිළිබඳ නිවේදන, සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 01 වන දිනට පෙර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

5. (1) ඊළඟ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා ජුනි මස 30 වන දිනට පෙර තමා වෙත ඉදිරිපත් කරන ලෙස පුවත්පත් මගින් පුරවැසියන් වෙත කෙරෙන නිවේදනයක් භාෂාත්‍රයෙන් සෑම වර්ෂයක ම මැයි මස 31 වන දිනට පෙර පළ කිරීමට සහ සෑම වර්ෂයක ම මැයි මස 31 දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සභිකයන් වෙත නිවේදනය කිරීමට ද, ක්‍රියා කිරීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත (1) ඡේදය යටතේ නගරාධිපතිවරයා වෙත ලැබී ඇති යෝජනා අතරින් ක්‍රියාත්මක කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් බලය ලැබී ඇති යෝජනා පමණක් තෝරා ගෙන එක් එක් කොට්ඨාසය අනුව වෙන් කර ඒවා ප්‍රමුඛතා ගත කොට නගරාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සහ බැහැර කරනු ලබන යෝජනා වේ නම්, එසේ බැහැර කිරීමට පාදක වන හේතු පෙන්වා දෙමින් ඒ බව අදාළ පාර්ශවය වෙත දැනුම් දීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

**වියදම් ඇස්තමේන්තු කෙටුම්පත.**

6. ඊළඟ වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යෝජනා ද සමග පසුගිය වර්ෂ තුනක කාලය තුළ දරන ලද සත්‍ය වියදම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ප්‍රධාන ගණකාධිකාරීවරයා විසින් නගරාධිපතිවරයා විමසා, කොමසාරිස්වරයාගේ ද එකඟතාව ඇති ව සහභාගීත්ව අයවැය පිළිබඳ සියලු උපාය මාර්ග අනුගමනය කරමින් ඊළඟ වර්ෂය සඳහා සභාවේ වියදම් ඇස්තමේන්තුව කෙටුම්පත් කළ යුතු ය.

**ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත.**

7. ප්‍රධාන ගණකාධිකාරීවරයා විසින් නගරාධිපතිවරයා විමසා, කොමසාරිස්වරයාගේ ද එකඟතාව ඇති ව ඊළඟ වර්ෂය තුළ සභාවේ යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත පිළියෙළ කළ යුතු ය.

**ඊළඟ වර්ෂයේ ආදායම් පිළිබඳ ඇස්තමේන්තුව සහ යෝජිත වියදම් පිළිබඳ විස්තරය**

8. 7 වන නියෝගය සහ 6 වන නියෝගය යටතේ පිළියෙළ කරනු ලැබූ පිළිවෙළින් ඊළඟ වර්ෂය සඳහා යෝජිත ආදායම් පිළිබඳ ව ඇස්තමේන්තුව සහ වියදම් පිළිබඳ විස්තරය මහා නගර සභා ආඥාපනතේ 211 වන වගන්තියේ සහ 212 වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව, සෑම වර්ෂයක ම ඔක්තෝබර් මස 31 වන දිනට පෙර පවත්වනු ලබන සභා රැස්වීමක දී ඉදිරිපත් කිරීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

**ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බැලීම සහ සංශෝධන ඉදිරිපත් කිරීමේ පටිපාටිය.**

9. (1) සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 15 වන දිනට පෙර නගරාධිපතිවරයා විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් දිනයක දී ඊළඟ වර්ෂය සඳහා වන අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කර ගැනීම සඳහා සභාවේ විශේෂ රැස්වීමක දී ඉදිරිපත් කළ යුතු ය.

(2) නගරාධිපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනයට, සභාවේ යම් සභිකයකු විසින් සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එකී සංශෝධන ස්වකීය අත්සනින් යුතු ව සංශෝධනයට පාදක වන හේතු ද සමග වැඩ කරන දින තුනකට පෙර නාගරික ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

(3) ඉහත (2) ඡේදය යටතේ අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් වී නැතිනම්, ඒ බව නගරාධිපතිවරයා විසින් එකී විශේෂ මහා සභා රැස්වීමේ දී නිවේදනය කළ යුතු අතර, අයවැය

ලේඛනයට සංශෝධන ඉදිරිපත් කර ඇත්නම්, ඒවා ලැබී ඇති අනුපිළිවෙළ අනුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන විශේෂ රැස්වීම ආරම්භ කළ වහාම, එම සංශෝධන යෝජනා පිටපතක් බැගින් සෑම සභිකයකු වෙත ම ලබා දීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) ඉහත (1) ඡේදය යටතේ පවත්වනු ලබන විශේෂ මහා සභා රැස්වීමේ දී, නගරාධිපතිවරයා විසින් ස්වකීය අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම නියෝගවල මතු දැක්වෙන විධිවිධාන යටතේ තමා විසින් පිළියෙළ කළ අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා වන යෝජනාව මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) නගරාධිපතිවරයා විසින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(6) අනතුරුව අයවැය ලේඛනයට ඉදිරිපත් කර ඇති සංශෝධන අනුපිළිවෙළ අනුව, අදාළ සභිකයා හෝ සභිකයන් විසින් එම සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු අතර එම සංශෝධන තවත් සභිකයකු විසින් ස්ථිර කරනු ලැබ ඇත්තේ නම් මිස ඒ පිළිබඳ ව සභාව විසින් කිසිදු කටයුත්තක් නොකළ යුතු ය.

(7) යම් සභිකයකු නමින් ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් සංශෝධනයක් වෙනත් සභිකයකු විසින් සභාවට ඉදිරිපත් නොකළ යුතු අතර එම සංශෝධනය සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ එම සංශෝධනය ගෙන ආ සභිකයා සභාව තුළ නොමැති විට, එම සංශෝධනය සභාවට ඉදිරිපත් වී නැති එකක් සේ සැළකිය යුතු ය.

(8) ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය විශේෂ මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව, එම අයවැය ලේඛනය සඳහා -

(අ) ඉදිරිපත් වී ඇති සංශෝධන සියල්ලට ම තමන් එකඟ වන්නේ නම්, ඒ බව; හෝ

(ආ) ඉදිරිපත් වී ඇති සංශෝධන අතරින් එක් සංශෝධනයකට හෝ සංශෝධන එකකට වැඩි ගණනකට තමන් එකඟ නොවන්නේ නම්, එසේ තමන් එකඟ නොවන සංශෝධන කවරේද යන්න සහ එසේ එකඟ නොවීමට පාදක කර ගත් හේතු කවරේද යන්න,

ලිඛිත ප්‍රකාශයක් සමග සභාවට දැනුම් දීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(9) ඉහත (8) ඡේදය යටතේ නගරාධිපතිවරයා තම නිවේදනය සභාවට දැනුම් දීමෙන් පසුව, 10 වන නියෝගයේ විධිවිධාන අනුගමනය කළ යුතු ය.

10. (1) මෙම නියෝග යටතේ මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සෑම යෝජනාවක් ම සම්මත කිරීම සම්බන්ධයෙන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ දී, ඊට අදාළ ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම මෙහි පහත පටිපාටියට අනුව සිදු කළ යුතු ය.

ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය, පරිපූරක අයවැය ලේඛනය සහ වෙනත් මුදල් යෝජනා සඳහා ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම.

(2) කිසියම් යෝජනාවක් නගරාධිපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කර ඇත්තේ නම් මිස, එකී කවර හෝ යෝජනාවක් පිළිබඳ ව සභාවේ දී සාකච්ඡාවට ගැනීම නොකළ යුතු අතර එකී යෝජනාව ස්ථිර කර ඇති විට ඒ පිළිබඳ විවාදයට අවස්ථාව ලබා දීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) කිසියම් යෝජනාවක් පිළිබඳ ව සභාවේ විවාදය අවසන් කිරීමෙන් පසුව, ඒ බව සභාවට නිවේදනය කිරීම සහ එකී යෝජනාව සම්මත කිරීම පිළිබඳ ඡන්දය විමසන ලෙස නාගරික ලේකම්වරයාට විධානය කිරීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) සභාවට ඉදිරිපත් කළ කිසියම් යෝජනාවකට පක්ෂ ව ඡන්දය දී ඇති, විපක්ෂ ව ඡන්දය දී ඇති, ඡන්දය දීමෙන් වැළකී සිටි හා ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භය තුළ නොසිටි සභිකයන් කවුරුන් ද යන්න සහ එදින රැස්වීමට පැමිණ සිටි සභිකයන් කවුරුන් ද යන්න හඳුනා ගත හැකි ආකාරයට එකී ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලය ඇතුළත් සටහනක්, නාගරික ලේකම්වරයා විසින් නගරාධිපතිවරයාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵලය, නගරාධිපතිවරයා විසින් සභාවට නිවේදනය කළ යුතු ය.

(5) ඉහත (3) ඡේදයේ පරිදි කිසියම් යෝජනාවකට අදාළ ඡන්ද විමසීමක දී, එකී යෝජනාවට විපක්ෂ ව ඡන්දය ලබා දුන් සෑම සභිකයකු විසින් ම, තමන් එසේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි කරන ලිඛිත සන්නිවේදනයක් එම රැස්වීම පවත්වනු ලැබූ දින සිට දින හතක් ගත වීමට පෙර පළාත් පාලන කොමසාරිස්වරයාට ද පිටපතක් සහිත ව නාගරික ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

(6) ඉහත (3) වන ඡේදයේ සඳහන් ඡන්ද විමසීමේ ප්‍රතිඵල සටහන (5) ඡේදයේ සඳහන් සියලු සන්නිවේදනවල එක් පිටපතක් ද සමඟ ඊට අදාළ රැස්වීමේ වාර්තාවේ අගට අමුණා තැබීම නාගරික ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

යම් අයවැය ලේඛනයක් සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කර ඇති විට අනුගමනය කළ යුතු පටිපාටිය.

11. (1) කිසියම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක, මහා නගර සභා පනතේ 215අ වගන්තියේ විධිවිධාන පරිදි එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය නැවත වරක් සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සම්මත කිරීම සඳහා වන යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට නගරාධිපතිවරයා විසින් ක්‍රියා කළ යුතු අතර එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(2) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය දෙවන වර සලකා බැලීමේ අවස්ථාවේ දී ද, යම් සභිකයකුට සංශෝධන ඉදිරිපත් කළ හැකි අතර ඒ සඳහා පළමු වර ඉදිරිපත් කළ සංශෝධනවලින් බැහැර වූ සංශෝධන කිසිවක් ඉදිරිපත් කිරීමට හිමිකම් නොතිබිය යුතු ය.

(3) දෙවන වරට ඉදිරිපත් කරනු ලැබූ අයවැය සම්මත කිරීම සම්බන්ධයෙන් ද 10 වන නියෝගයේ පටිපාටිය අනුගමනය කළ යුතු ය.

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමට පෙර ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

12. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමට කලින් වූ යම් දිනයක දී, සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 11 වන නියෝගය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්තේනම්, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දින සිට සති දෙකක් ඉක්ම වූ වහාම, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ දී සම්මත වූ සේ සලකා ක්‍රියා කිරීමට නගරාධිපතිවරයාට බලය තිබිය යුතු ය.

(2) ඉහත 1 ඡේදය යටතේ ලැබී ඇති බලය මත කටයුතු කිරීමට නගරාධිපතිවරයා විසින් තීරණය කරන ලද බව විගණකාධිපතිට සහ පළාත් පාලන කොමසාරිස්ට ද පිටපත් සහිත ව සෑම සභිකයකු වෙත ම ලිඛිත ව දැනුම් දීම සහ සභාවේ ඊළඟ සභා රැස්වීමේ දී ඒ බව සභාවට නිවේදනය කිරීම ද නගරාධිපතිවරයාගේ කාර්ය විය යුතු ය.

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

13. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමෙන් පසුව එළඹෙන යම් දිනයක දී සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 11 වන නියෝගය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම්, මෙම නියෝගයේ මතු දැක්වෙන විධිවිධාන එහි දී අදාළ විය යුතු ය.

(2) එම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබ ඇත්තේ -

(අ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් ව නොමැතිව තිබිය දී; හෝ

(ආ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ඉදිරිපත් කරන ලද සංශෝධනවලට නගරාධිපතිවරයා එකඟ වී තිබෙන අවස්ථාවක දී,

වන විට, මෙහි (4) වන, (5) වන සහ (6) වන ඡේදවල පටිපාටිය අනුගමනය කළ යුතු ය.

(3) සභිකයන් විසින් එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ගෙන එන ලද කිසියම් සංශෝධන එකකට හෝ කිහිපයකට නගරාධිපතිවරයා එකඟ වී නැති විටක, සභාව විසින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබ ඇත්තේ නම්, එහි දී මහා නගර සභා ආඥාපනතේ 215අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) ඉහත (2) වන ඡේදයේ දැක්වෙන කවර හෝ ආකාරයකින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක -

(අ) මෙම නියෝගවල නියම යටතේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධ ප්‍රාරම්භක ක්‍රියාකාරකම් සිදු කර තිබේ ද නැති ද යන බව කොමසාරිස්වරයා විසින් තහවුරු කරනු ලැබූ වාර්තාවක්;

(ආ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන අවස්ථාවට සභිකයන් විසින් සභාවට ඉදිරිපත් කර ඇති සංශෝධන අතරින් නගරාධිපතිවරයා එකඟ නොවූ සංශෝධනවල පිටපත් හා නගරාධිපතිවරයා එසේ එකඟ නොවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද හේතු පැහැදිලි කරනු ලැබූ ලිඛිත ප්‍රකාශවල පිටපත්;

(ඇ) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී, 10 වන නියෝගය යටතේ සභිකයන් විසින් ඡන්දය ප්‍රකාශ කළ ආකාරය සටහන් කළ ලේඛනයේ පිටපතක් බැගින්; සහ

(ඈ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී විපක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ යම් සභිකයකු විසින් 10 (5) නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇති ලිඛිත සන්නිවේදනවල පිටපතක් බැගින්,

නගරාධිපතිවරයා විසින් කොමසාරිස්වරයාගේ සහතිකයක් ද සමග හැකි පහසු ඉක්මනින් පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කළ යුතු ය.

(5) නගරාධිපතිවරයාගේ ඉහත කී වාර්තාව සැලකිල්ලට ගනිමින්, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව පළාත් පාලන කොමසාරිස්වරයා විසින්, එකී වාර්තාව තමන් වෙත ලැබී දින තුනක් ඇතුළත ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) ඉහත (5) වන ඡේදය යටතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් එකී වාර්තාව ලැබුණු දින සිට දින හතක් ඇතුළත එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ සම්මත කරන ලද අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් වන්නේ ද නැති ද යන්න, ඊට හේතු පැහැදිලි කරන ලිඛිත ප්‍රකාශයක් ද සහිත ව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයාගේ එකී තීරණය;

(අ) පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණකාධිපතිට, පළාත් පාලන කොමසාරිස්ට සහ නාගරික ලේකම්වරයාට ද පිටපත් සහිත ව වහාම නගරාධිපතිවරයා වෙත දැන්විය යුතු ය.

(ආ) නාගරික ලේකම්වරයා විසින් හැකි පහසු ඉක්මණින් සභාවේ සභිකයන් වෙත දන්වා යැවිය යුතු ය.

(7) එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඉහත (6) ඡේදය යටතේ -

(අ) යථා පරිදි සම්මත වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, වෙනත් පටහැණි කිසියම් හේතුවක් නොවන්නේ නම් මිස, එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය වලංගු එකක් ලෙස සැලකිය යුතුවාත් හැර එකී නගරාධිපතිවරයාට තවදුරටත් ස්වකීය නගරාධිපති ධුරයේ කටයුතු කරනු ලැබිය හැකි අතර එකී තීරණය නගරාධිපතිවරයා විසින් සභාවේ ඊළඟ රැස්වීමේ දී සභාවට වාර්තා කළ යුතු ය.

(ආ) ප්‍රතික්ෂේප වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට නගරාධිපතිවරයා ස්වකීය නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලැබිය යුතු ය.

(8) ඉහත 13 (3) ඡේදය සහ 13 (7) (ආ) ඡේදය යටතේ නගරාධිපතිවරයා ස්වකීය නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලබන අවස්ථාවක, එම සභාවේ නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

අනුප්‍රාප්තික නගරාධිපතිවරයා විසින් අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු බව සහ සභාව විසුරුවා හැර ඇති සේ සලකනු ලබන අවස්ථාව.

14. (1) 13 වන නියෝගයේ (3) ඡේදය යටතේ හෝ (7) (ආ) ඡේදය යටතේ නගරාධිපතිවරයා ස්වකීය නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් අනතුරුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ එම නගරාධිපති ධුරයේ පුරප්පාඩුව සඳහා පත් කරනු ලැබූ අනුප්‍රාප්තික නගරාධිපතිවරයා විසින් හැකිතාක් ඉක්මණින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය හෝ අදාළ වර්ෂයේ පරිපූරක අයවැය ලේඛනය, සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ආකාරයෙන් ම, එකී වර්ෂයෙන් පසුව එළඹෙන සෑම වර්ෂයක් ම සඳහා වන අයවැය ලේඛන සහ අවශ්‍ය වන්නේ නම් පරිපූරක අයවැය ලේඛන සම්මත කර ගැනීම සඳහා ක්‍රියා කිරීම ද අනුප්‍රාප්තික නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) අනුප්‍රාප්තික නගරාධිපතිවරයා විසින් අයවැය ලේඛන හෝ පරිපූරක අයවැය ලේඛන සභාවට ඉදිරිපත් කිරීමේ දී, අයවැය ලේඛනය සම්මත කිරීමේ දී සහ ප්‍රතික්ෂේප කිරීමේ දී ද මෙම නියෝගවල ඉහත සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

(4) ඉහත (3) ඡේදයේ කුමක් සඳහන් වුව ද, අනුප්‍රාප්තික නගරාධිපතිවරයා විසින් සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කර එම අවස්ථාවේ දී ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, නැවත සලකා බැලීම සඳහා දෙවන වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ නම්, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට සභාව විසුරුවා හරිනු ලබන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(5) ඉහත පරිදි සභාව විසුරුවා හරින ලද සේ සලකනු ලැබ ඇති විට, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2වන වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාර සහ, අවස්ථාවෝචිත පරිදි පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් සභාවේ ඉතිරි කාල සීමාව සඳහා විශේෂ කොමසාරිස්වරයකු ලෙස ධුර දරන විශේෂ කොමසාරිස්වරයකු පත් කළ යුතුය.

සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක අයවැය සම්මත කිරීම.

15. ඉහත 14 වන නියෝගය යටතේ සභාව විසුරුවා හැර ඇති ලෙස සලකනු ලැබීමෙන් පසුව, එම සභාවට පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා විසින් ඊළඟ වර්ෂයේ සහ ඉන් අනතුරුව එළඹෙන වර්ෂ සඳහා වන අයවැය ලේඛන සහ අවස්ථාවෝචිත පරිදි පරිපූරක අයවැය ලේඛන පිළියෙළ කිරීම හා සම්මත කිරීම පිළිබඳ තීරණ ගනු ලැබිය යුතු ය.

16. (1) කිසියම් සභාවක අයවැය ලේඛනය අදාළ වර්ෂය ආරම්භ වීමට පෙර සම්මත කිරීමට නොහැකි වුව ද, එම වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්මත කර ගනු ලබන තෙක්, 8 වන නියෝගය යටතේ සභාව වෙත ඉදිරිපත් කර ඇති යෝජිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තුවේ සහ යෝජිත වියදම් පිළිබඳ විස්තරයෙහි ඇතුළත් වන පුනරාවර්තන වියදම් සඳහා මුදල් වැය කිරීමට එම සභාවට බාධාවක් නොවිය යුතු ය. මුදල් වර්ෂය ආරම්භ වන තෙක් අයවැය ලේඛනය සම්මත නොවුන අවස්ථාවක මුදල් වියදම් කිරීම.

(2) එසේ වුව ද, අදාළ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත වී ඇති සේ සැලකීමට හැකියාව ලැබෙන තෙක් කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීම නොකළ යුතු ය.

17. අවශ්‍ය යැයි නගරාධිපතිවරයා විසින් අදහස් කරනු ලබන කවර අවස්ථාවක වුව ද, පරිපූරක අයවැය ලේඛනයක් පිළියෙළ කර සභාවට ඉදිරිපත් කළ හැකි අතර, එහි දී මහා නගර සභා ආඥාපනතේ 214 වගන්තියේ විධිවිධාන සහ මෙම නියෝගවල 9 වන නියෝගයේ සිට 15 වන නියෝගය දක්වා (එම නියෝග දෙක ද ඇතුළත් ව) වන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය. පරිපූරක අයවැය ලේඛනය.

18. සභාවක අයවැය ලේඛනය සම්බන්ධයෙන් වෙනත් යම් නියෝගයක හෝ නියෝගවල ඇතුළත් විධිවිධාන, මෙම නියෝගවල ඇතුළත් විධිවිධානවලට පටහැණි වන අවස්ථාවක, එම විධිවිධාන අභිබවා මෙම නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතු ය. වෙනත් යම් නියෝගයක විධිවිධාන ඉක්මවා මේ නියෝග බලපවත්වන බව.

19. ඉහත සඳහන් නියෝගවල කුමක් සඳහන් ව තිබුණ ද, 2021 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්බන්ධයෙන් වන විට - අන්තර්කාලීන විධිවිධාන.

(අ) මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන තෙක් ම, 4 (1) නියෝගය යටතේ 2021 වර්ෂය සඳහා ආදායම් නියම කිරීමේ යෝජනාව සම්මත කර ගෙන නොමැති නම්, එහි සඳහන් "සැප්තැම්බර් මස 30" යන්න වෙනුවට, "නොවැම්බර් මස 30" වශයෙන් ද;

(ආ) 5 (1) නියෝගයේ සංවර්ධන යෝජනා යොමු කරන ලෙස දැනුම් දීම නිවේදනය කිරීමට නියම කළ දිනය වන "මැයි මස 31" යන්න වෙනුවට, "නොවැම්බර් මස 15" දිනය වශයෙන් ද;

(ඇ) 5 (1) නියෝගයේ සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වශයෙන් නියම කළ "ජුනි මස 30" යන්න වෙනුවට, "නොවැම්බර් මස 05" වශයෙන් ද; සහ

(ඈ) 8 වන නියෝගය යටතේ ඊළඟ වර්ෂයේ යෝජිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තුව සහ වියදම් පිළිබඳ විස්තරය මහා සභාවට ඉදිරිපත් කිරීමට අවසන් දිනය වශයෙන් නියම කළ "ඔක්තෝබර් මස 31" යන්න වෙනුවට, "නොවැම්බර් මස 15" වශයෙන් ද,

අදාළ විය යුතු ය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම නියෝගවල, - අර්ථ නිරූපණය.

"අනුප්‍රාප්තික නගරාධිපතිවරයා" යන්නෙන්, 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 215අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් නගරාධිපතිවරයා ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් පසුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ හෝ 66උ වගන්තිය යටතේ, පුරප්පාඩු වී ඇති නගරාධිපති ධුරයට පත් කරනු ලැබූ නගරාධිපතිවරයා ද;

"අමාත්‍යවරයා" යන පදයට, පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වන අතර එම පළාතේ පළාත් සභාව විසුරුවා හැර ඇති යම් අවස්ථාවක ඊට එම පළාතේ ආණ්ඩුකාරවරයා ද ඇතුළත් විය යුතු ය;

"නගරාධිපතිවරයා" යන්නට, 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 327 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ද;

"කොමසාරිස්වරයා" යන්නට, 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 327 වන වගන්තියෙහි කොමසාරිස්වරයා යන්නට දී ඇති අර්ථය ම ද;

"නාගරික ලේකම්" යන්නෙන්, සභාවේ මහා සභා කටයුතු කළමනාකරණය හා මෙහෙයවීම කරන දෙපාර්තමේන්තුව භාර නිලධාරියා ද;

"සභාව" යන්නෙන්, 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනත යටතේ වයඹ පළාත තුළ සංස්ථාපනය කරනු ලැබ ඇති මහා නගර සභාවක් ද;

අදහස් විය යුතු ය.

---

## පළාත් පාලන නිවේදන

### 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 193 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ ආණ්ඩුකාරවර . රාජා කොල්ලූරේ වන මා විසින් සාදන ලද පහත සඳහන් රීති මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**රාජා කොල්ලූරේ,**
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
කුරුණෑගල දී ය.

### රීති

ලුහුඬු නාමය.

1. මෙම රීති 2020 නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

රීතිවල පටිපාටිය අනුගමනය කළ යුතු බව.

2. 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 178 වන වගන්තිය අනුව සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු, ඊළඟ වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම, සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම, අයවැය යෝජනාව සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම මෙම රීතිවලින් නියම කර ඇති පටිපාටිය අනුව සිදු කළ යුතු ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව.

3. (1) සෑම වර්ෂයක ම ජනවාරි මස මහා සභා රැස්වීමේ දී, නගර සභා ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් සඳහා සාමාජිකයන් පත් කර ගැනීම කළ යුතු අතර එහි සභාපති ධූරය, සභාවේ සභාපතිවරයා විසින් දැරිය යුතු ය.

(2) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් කලින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, නගර සභාවක් විසින් මෙම රීතිවල විධිවිධාන අදාළ වන කිසිම කාරණයක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු ය.

ආදායම් හා වියදම් ඇස්තමේන්තු පිළිබඳ ප්‍රාරම්භක ක්‍රියා.

4. ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීමට අවශ්‍ය ආදායම් ප්‍රභව හඳුනා ගැනීම, සභාව සතු වත්කම් මෙහෙයවීම සඳහා වැය ප්‍රතිපාදන පුරෝකථනය සහ වෙනත් පුනරාවර්තන වියදම් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම සඳහා ප්‍රාරම්භක වැඩපිළිවෙළ යෙදීම ගණකාධිකාරීවරයාගේ සහ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

ආදායම් නියම කිරීමේ සහ යෝජනා සම්මත කිරීම සහ ආදායම් නියම කිරීමේ යෝජනා පිළිබඳ නිවේදන පළ කිරීම.

5. (1) ගණකාධිකාරීවරයා විසින් සභාපතිවරයා විමසා ලේකම්වරයාගේ ද එකඟතාව ඇති ව, ඊළඟ වර්ෂය සඳහා සභාවට අය කර ගත යුතු හා අය කර ගත හැකි වරිපනම්, බදු, කුලී ආදායම් සහ සභාව විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අය කර ගත යුතු ගාස්තු නියම කිරීමේ සහ යෝජනා කෙටුම්පත් කර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාවක් ද සමග සැප්තැම්බර් මස 30 වන දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) සභාව විසින් සම්මත කරන ලද වරිපනම්, බදු, කුලී ආදායම් හා ගාස්තු නියම කිරීමට අදාළ යෝජනා පිළිබඳ නිවේදන, සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 01 වන දිනට පෙර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

සංවර්ධන යෝජනා කැඳවීම හා ප්‍රමුඛතාගත කිරීම.

6. (1) 2021 වර්ෂයට අදාල අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියෙන් පසුව එළඹෙන ඊළඟ වර්ෂයේ සිට ඊළඟ වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා ජුනි මස 30 වන දිනට පෙර තමා වෙත ඉදිරිපත් කරන ලෙස පුවත් පත් මගින් පුරවැසියන් වෙත කෙරෙන නිවේදනයක් භාෂාත්‍රයෙන් සෑම වර්ෂයක ම මැයි මස 31 වන දිනට පෙර පළ කිරීමට සහ සෑම වර්ෂයක ම මැයි මස 31 දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සභිකයන් වෙත නිවේදනය කිරීමට ද, ක්‍රියා කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත (1) ඡේදය යටතේ සභාපතිවරයා වෙත ලැබී ඇති යෝජනා අතරින් ක්‍රියාත්මක කිරීම සඳහා නගර සභා ආඥාපනතෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් බලය ලැබී ඇති යෝජනා පමණක් තෝරා ගෙන එක් එක් කොට්ඨාසය අනුව වෙන් කර ඒවා ප්‍රමුඛතා ගත කොට සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සහ බැහැර කරනු ලබන යෝජනා වේ නම්, එසේ බැහැර කිරීමට පාදක වන හේතු පෙන්වා දෙමින් ඒ බව අදාළ පාර්ශවය වෙත දැනුම් දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

වියදම් ඇස්තමේන්තු කෙටුම්පත.

7. ඊළඟ වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යෝජනා ද සමග පසුගිය වර්ෂ තුනක කාලය තුළ දරන ලද සත්‍ය වියදම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ගණකාධිකාරීවරයා විසින් සභාපතිවරයා විමසා, ලේකම්වරයාගේ ද එකඟතාව ඇති ව සහභාගීත්ව අයවැය පිළිබඳ සියළු උපාය මාර්ග අනුගමනය කරමින් ඊළඟ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ද ඇතුළත් කරමින් ඊළඟ වර්ෂයේ සභාවේ වියදම් ඇස්තමේන්තුව කෙටුම්පත් කළ යුතු ය.

ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත.

8. ගණකාධිකාරීවරයා විසින් සභාපතිවරයා විමසා, ලේකම්වරයාගේ ද එකඟතාව ඇති ව ඊළඟ වර්ෂය තුළ සභාවේ ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත පිළියෙළ කළ යුතු ය.

ඊළඟ වර්ෂයේ ආදයම් හා වියදම් ඇස්තමේන්තුව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශ

9. 7 වන රීතිය සහ 8 වන රීතිය යටතේ කෙටුම්පත් කරනු ලැබූ පිළිවෙළින් ඊළඟ වර්ෂයේ යෝජිත වියදම් ඇස්තමේන්තුව සහ යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තුව සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම සඳහා සභාපතිවරයා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කිරීම.

10. (1) සෑම වර්ෂයක ම නොවැම්බර් මස 15 වන දිනට පෙර, සභාපතිවරයා විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් දිනයක දී ඊළඟ වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කර ගැනීම සඳහා සභාවේ සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක දී ඉදිරිපත් කළ යුතු ය.

(2) අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන එම රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් වැඩ කරන දින හතකට පෙර, එම කෙටුම්පත් අයවැය ලේඛනය -

(අ) එම රැස්වීමේ න්‍යාය පත්‍රය සමග සෑම සභිකයකු වෙත ම භාර දීමට; සහ

(ආ) පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට අවස්ථාව සලසා දෙනු ලබන බවට වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් පුවත් පත් දෙකක භාෂාත්‍රයෙන් ම පළ කිරීම,

සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) මෙම රීතිය යටතේ ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සලකා බැලීම සඳහා පවත්වනු ලබන මහා සභා රැස්වීමේ දී, සභාපතිවරයා විසින් ස්වකීය අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම රීතිවල විධිවිධාන යටතේ වූ කෙටුම්පත් අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා වන යෝජනාව මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) සභාපතිවරයා විසින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(5) සභාපතිවරයාගේ අයවැය යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව, අයවැය ලේඛනය සලකා බැලීම මෙම රීතිවල මින් මතු දැක්වෙන විධිවිධාන අනුව විය යුතු ය.

අයවැය ලේඛනය සඳහා වන සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම.

11. (1) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනයට, සභාවේ යම් සභිකයකු විසින් සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එකී සංශෝධන ස්වකීය අත්සනින් යුතු ව සංශෝධනයට පාදක වන හේතු ද සමග වැඩ කරන දින තුනකට පෙර ලේකම්වරයා වෙත භාර දිය යුතු ය

(2) ඉහත (1) ඡේදය යටතේ අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් වී නැතිනම්, ඒ බව සභාපතිවරයා විසින් එකී මහා සභා රැස්වීමේ දී නිවේදනය කළ යුතු අතර, අයවැය ලේඛනයට සංශෝධන ඉදිරිපත් කර ඇත්නම්, ඒවා ලැබී ඇති අනුපිළිවෙළ අනුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන රැස්වීම ආරම්භ කළ වහාම, එම සංශෝධන යෝජනා පිටපතක් බැගින් සෑම සභිකයකු වෙත ම ලබා දීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ ඊළඟ වර්ෂයේ අයවැය යෝජනාව වෙනත් සභිකයකු විසින් ස්ථිර කිරීමෙන් පසුව අයවැය ලේඛනයට සංශෝධන ඉදිරිපත් කර ඇති අනුපිළිවෙළ අනුව, අදාළ සභිකයා හෝ සභිකයන් විසින් එම සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) ලැබී ඇති අනුපිළිවෙළ අනුව අදාළ සභිකයා විසින් අයවැය ලේඛනයට ඉදිරිපත් කරන ලද සංශෝධන, සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව එම සංශෝධන තවත් සභිකයකු විසින් ස්ථිර කර ඇත්තේ නම් මිස ඒ පිළිබඳ ව සභාව විසින් කිසිදු කටයුත්තක් නොකළ යුතු ය.

(5) යම් සභිකයකු නමින් ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් සංශෝධනයක් වෙනත් සභිකයකු විසින් සභාවට ඉදිරිපත් නොකළ යුතු අතර එම සංශෝධනය සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ එම සංශෝධනය ගෙන ආ සභිකයා සභාව තුළ නොමැති විට, එම සංශෝධනය සභාවට ඉදිරිපත් වී නැති එකක් සේ සැලකිය යුතු ය.

(6) ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනයට අදාළ සංශෝධන සියල්ල ම මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව, -

(අ) ඉදිරිපත් වී ඇති සංශෝධන සියල්ලට ම තමන් එකඟ වන්නේ නම්, ඒ බව; හෝ

(ආ) ඉදිරිපත් වී ඇති සංශෝධන අතරින් එක් සංශෝධනයකට හෝ සංශෝධන එකකට වැඩි ගණනකට තමන් එකඟ නොවන්නේ නම්, එසේ තමන් එකඟ නොවන සංශෝධන කවරේද යන්න සහ එසේ එකඟ නොවීමට පාදක කර ගත් හේතු කවරේද යන්න,

ලිඛිත ප්‍රකාශයක් සමග සභාවට දැනුම් දීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(7) අනතුරුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සලකා බැලීම සඳහා 12 වන රීතියේ විධිවිධාන අනුගමනය කළ යුතු ය.

ආදායම් නියම කිරීමේ, අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය සඳහා ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම.

12. (1) මෙම රීති යටතේ සභාවට ඉදිරිපත් කරනු ලබන සෑම යෝජනාවක් ම සම්මත කිරීම සම්බන්ධයෙන් සභාව තීරණය කිරීමේ දී, ඊට අදාළ ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම පහත පටිපාටිය අනුව සිදු කළ යුතු ය.

(2) කිසියම් යෝජනාවක් සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කර ඇත්තේ නම් මිස, එකී කවර හෝ යෝජනාවක් පිළිබඳ ව සභාවේ දී සාකච්ඡාවට ගැනීම නොකළ යුතු අතර එකී යෝජනාව ස්ථිර කර ඇති විට ඒ පිළිබඳ විවාදයට අවස්ථාව ලබා දීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(3) එම යෝජනා පිළිබඳ ව සභාවේ විවාදය අවසන් කිරීමෙන් පසුව, ඒ බව සභාවට නිවේදනය කිරීම සහ එකී යෝජනාව සම්මත කිරීම පිළිබඳ ඡන්දය විමසන ලෙස ලේකම්වරයාට විධානය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) සභාවට ඉදිරිපත් කළ කිසියම් යෝජනාවකට පක්ෂ ව ඡන්දය දී ඇති, විපක්ෂ ව ඡන්දය දී ඇති, ඡන්දය දීමෙන් වැළකී සිටි හා ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භය තුළ නොසිටි සභිකයන් කවුරුන් ද යන්න සහ එදින රැස්වීමට පැමිණ සිටි සභිකයන් කවුරුන් ද යන්න හඳුනා ගත හැකි ආකාරයට එකී ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලය ඇතුළත් සටහනක්, ලේකම්වරයා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සභාපතිවරයා විසින් එම ප්‍රතිඵලය සභාවට නිවේදනය කළ යුතු ය.

(5) ඉහත (3) ඡේදයේ පරිදි කිසියම් යෝජනාවකට අදාළ ඡන්ද විමසීමක දී, එකී යෝජනාවට විපක්ෂ ව ඡන්දය ලබා දුන් සෑම සභිකයකු විසින් ම, තමන් එසේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි කරන ලිඛිත සන්නිවේදනයක් එම රැස්වීම පවත්වනු ලැබූ දින සිට දින හතක් ගත වීමට පෙර පළාත් පාලන කොමසාරිස්වරයාට ද පිටපතක් සහිත ව ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

(6) ඉහත (4) වන ඡේදයේ සඳහන් ඡන්ද විමසීමේ ප්‍රතිඵල සටහන සහ (5) ඡේදයේ සඳහන් සියලු සන්නිවේදනවල එක් පිටපතක් ද සමග ඊට අදාළ රැස්වීමේ වාර්තාවේ අගට අමුණා තැබීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

යම් අයවැය ලේඛනයක් සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කර ඇති විට අනුගමනය කළ යුතු පරිපාටිය.

13. (1) කිසියම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක, නගර සභා ආඥාපනතේ 178අ වගන්තියේ විධිවිධාන පරිදි එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය නැවත වරක් සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සම්මත කිරීම සඳහා වන යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට සභාපතිවරයා විසින් ක්‍රියා කළ යුතු අතර එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(2) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය දෙවන වර සලකා බැලීමේ අවස්ථාවේ දී ද, යම් සභිකයකුට සංශෝධන ඉදිරිපත් කළ හැකි අතර ඒ සඳහා පළමු වර ඉදිරිපත් කළ සංශෝධනවලින් බැහැර වූ සංශෝධන කිසිවක් ඉදිරිපත් කිරීමට හිමිකම් නොතිබිය යුතු ය.

(3) දෙවන වරට ඉදිරිපත් කරනු ලැබූ අයවැය සම්මත කිරීම සම්බන්ධයෙන් ද 12 වන රීතියේ පටිපාටිය අනුගමනය කළ යුතු ය.

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමට පෙර ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

14. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමට පෙර වූ යම් දිනයක දී, පළමු වරට සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 13 වන රීතිය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම්, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දින සිට සති දෙකක් ඉක්ම වූ වහාම, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ දී සම්මත වූ සේ සලකා ක්‍රියා කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය.

(2) ඉහත 1ඡේදය යටතේ කටයුතු කිරීමට සභාපතිවරයා විසින් තීරණය කරන ලද බව විගණකාධිපති, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන සහකාර කොමසාරිස්ට ද පිටපත් සහිත ව සෑම සභිකයකු වෙත ම ලිඛිත ව දැනුම් දීම සහ සභාවේ ඊළඟ රැස්වීමේ දී ඒ බව සභාවට නිවේදනය කිරීම ද සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

15. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමෙන් පසුව එළඹෙන යම් දිනයක දී සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 13 වන රීතිය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම්, මෙම රීතියේ මතු දැක්වෙන විධිවිධාන එහි දී අදාළ විය යුතු ය.

(2) එම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබ ඇත්තේ -

(අ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් ව නොමැතිව තිබිය දී; හෝ

(ආ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ඉදිරිපත් කරන ලද සංශෝධනවලට සභාපතිවරයා එකඟ වී තිබෙන අවස්ථාවක දී,

වන විට, මෙහි (4) වන, (5) වන සහ (6) වන ඡේදවල පටිපාටිය අනුගමනය කළ යුතු අතර එම විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(3) සභිකයන් විසින් එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ගෙන එන ලද සංශෝධන එකකට හෝ කිහිපයකට සභාපතිවරයා එකඟ වී නැති විටක, සභාව විසින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ නම්, එහි දී නගර සභා ආඥාපනතේ 178අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) ඉහත (2) වන ඡේදයේ දැක්වෙන කවර හෝ ආකාරයකින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක -

(අ) මෙම රීතිවල නියම යටතේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධ ප්‍රාරම්භක ක්‍රියාකාරකම් සිදුකර තිබේ ද නැති ද යන බව ලේකම්වරයා විසින් තහවුරු කරනු ලැබූ වාර්තාවක්;

(ආ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන අවස්ථාවට සභිකයන් විසින් සභාවට ඉදිරිපත් කර ඇති සංශෝධන අතරින් සභාපතිවරයා එකඟ නොවූ සංශෝධනවල පිටපත් හා සභාපතිවරයා එසේ එකඟ නොවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද හේතු පැහැදිලි කරනු ලැබූ ලිඛිත ප්‍රකාශවල පිටපත්;

(ඇ) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී, 12 වන රීතිය යටතේ සභිකයන් විසින් ඡන්දය ප්‍රකාශ කළ ආකාරය සටහන් කළ ලේඛනයේ පිටපතක් බැගින්; සහ

(ඈ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී විපක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ යම් සභිකයකු විසින් 12 (5) රීතිය යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇති ලිඛිත සන්නිවේදනවල පිටපතක් බැගින්,

සභාපතිවරයා විසින් ලේකම්වරයාගේ සහතිකයක් ද සමග හැකි පහසු ඉක්මනින් පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කළ යුතු ය.

(5) සභාපතිවරයාගේ ඉහත කී වාර්තාව සැලකිල්ලට ගනිමින්, අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව පළාත් පාලන කොමසාරිස්වරයා විසින්, එකී වාර්තාව තමන් වෙත ලැබී දින තුනක් ඇතුළත ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) ඉහත (5) වන ඡේදය යටතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් එකී වාර්තාව ලැබුණු දින සිට දින හතක් ඇතුළත එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ සම්මත කරන ලද අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් වන්නේ ද නැති ද යන්න, ඊට හේතු පැහැදිලි කරන ලිඛිත ප්‍රකාශයක් ද සහිත ව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයාගේ එකී තීරණය;

(අ) පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් විගණකාධිපතිට, පළාත් පාලන කොමසාරිස්ට, පළාත් පාලන සහකාර කොමසාරිස්ට සහ ලේකම්වරයාට ද පිටපත් සහිත ව වහාම සභාපතිවරයා වෙත දැන්විය යුතු ය.

(ආ) ලේකම්වරයා විසින් හැකි පහසු ඉක්මණින් සභාවේ සභිකයන් වෙත දන්වා යැවිය යුතු ය.

(7) එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඉහත (6) ඡේදය යටතේ -

(අ) යථා පරිදි සම්මත වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, වෙනත් පටහැණි කිසියම් හේතුවක් නොවන්නේ නම් මිස, එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය වලංගු එකක් ලෙස සැලකිය යුතුවාත් හැර එකී සභාපතිවරයාට තවදුරටත් ස්වකීය සභාපති ධුරයේ කටයුතු කරනු ලැබිය හැකි අතර එකී තීරණය සභාපතිවරයා විසින් සභාවේ ඊළඟ රැස්වීමේ දී සභාවට වාර්තා කළ යුතු ය.

(ආ) ප්‍රතික්ෂේප වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලැබිය යුතු ය.

(8) ඉහත (3) සහ (7) (ආ) ඡේද යටතේ සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලබන අවස්ථාවක, එම සභාවේ සභාපතිවරයා තෝරාපත්කර ගැනීම සඳහා 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

*අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු බව සහ සභාව විසුරුවා හැර ඇති සේ සලකනු ලබන අවස්ථාව.*

16. (1) 15 වන රීතිය යටතේ සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් අනතුරුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ එම සභාපති ධුරයේ පුරප්පාඩුව සඳහා පත් කරනු ලැබූ අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් හැකිතාක් ඉක්මණින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක් දී සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ආකාරයෙන් ම, එකී වර්ෂයෙන් පසුව එළඹෙන සෑම වර්ෂයක් ම සඳහාවන අයවැය ලේඛන සහ අවශ්‍ය වන්නේ නම් පරිපූරක අයවැය ලේඛන සම්මත කර ගැනීම සඳහා ක්‍රියා කිරීම ද අනුප්‍රාප්තික සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් අයවැය ලේඛන හෝ පරිපූරක අයවැය ලේඛන සභාවට ඉදිරිපත් කිරීමේ දී, අයවැය ලේඛනය සම්මත කිරීමේ දී සහ ප්‍රතික්ෂේප කිරීමේ දී ද මෙම රීතිවල ඉහත සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

(4) ඉහත (3) ඡේදයේ කුමක් සඳහන් වුව ද, අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කර එම අවස්ථාවේ දී ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, නැවත සලකා බැලීම සඳහා දෙවන වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ නම්, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට සභාව විසුරුවා හරිනු ලබන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(5) ඉහත පරිදි සභාව විසුරුවා හරින ලද සේ සලකනු ලැබ ඇති විට, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2වන වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාර සහ, අවස්ථාවෝචිත පරිදි පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් සභාවේ ඉතිරි කාල සීමාව සඳහා විශේෂ කොමසාරිස්වරයකු ලෙස ධුර දරන විශේෂ කොමසාරිස්වරයකු පත් කළ යුතුය.

සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක අයවැය සම්මත කිරීම

17. ඉහත 16 වන රීතිය යටතේ සභාව විසුරුවා හැර ඇති ලෙස සලකනු ලැබීමෙන් පසුව, එම සභාවට පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා විසින් ඊළඟ වර්ෂයේ සහ ඉන් අනතුරුව එළඹෙන වර්ෂ සඳහා වන අයවැය ලේඛන සහ අවස්ථාවෝචිත පරිදි පරිපූරක අයවැය ලේඛන පිළියෙළ කිරීම හා සම්මත කිරීම පිළිබඳ තීරණ ගනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය ආරම්භ වන තෙක් අයවැය සම්මත නොවුන අවස්ථාවක මුදල් වියදම් කිරීම.

18. (1) කිසියම් සභාවක අයවැය අදාළ වර්ෂය ආරම්භ වීමට පෙර සම්මත කිරීමට නොහැකි වුව ද, එම වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්මත කර ගනු ලබන තෙක්, 10 වන රීතිය යටතේ සභාව වෙත ඉදිරිපත් කර ඇති යෝජිත වියදම් පිළිබඳ ඇස්තමේන්තුවෙහි ඇතුළත් පුනරාවර්තන වියදම් සඳහා මුදල් වැය කිරීමට බාධාවක් නොවිය යුතු ය.

(2) එසේ වුව ද, අදාළ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත වී ඇති සේ සැලකීමට හැකියාව ලැබෙන තෙක් කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීම නොකළ යුතු ය.

පරිපූරක අයවැය ලේඛනය.

19. අවශ්‍ය යැයි සභාපතිවරයා විසින් අදහස් කරනු ලබන කවර අවස්ථාවක වුව ද, පරිපූරක අයවැය ලේඛනයක් පිළියෙළ කර සභාවට ඉදිරිපත් කළ හැකි අතර, එහි දී නගර සභා ආඥාපනතේ 178 වගන්තියේ විධිවිධාන සහ මෙම රීතිවල 7 වන රීතියේ සිට 17 වන රීතිය දක්වා (එම රීති දෙක ද ඇතුළත්ව) වන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

සම්මත කරනු ලැබූ අයවැය ලේඛනය සහ පරිපූරික අයවැය ලේඛනය මහජනතාවගේ පරිශීලනය සඳහා තබා තිබිය යුතු බව.

20. (1) සභාව අනුමත කරනු ලැබූ සෑම අයවැය ලේඛනයකම සහ පරිපූරක අයවැය ලේඛනයකම ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් සභාවේ ප්‍රධාන කාර්යාලයයේ, සෑම උප කාර්යාලයක ම සහ සෑම මහජන පුස්තකාලයක ම, ගාස්තු ගෙවීමකින් තොරව මහජනයා විසින් පරිශීලනය කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට ද සහ සභාවේ අන්තර්ජාල වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් එහිද ඒවායේ පිටපත් ඇතුළත් කිරීමට ද ලේකම්වරයා විසින් ක්‍රියා කළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ඒ යම් ලේඛනයක සම්පූර්ණ පිටපතක් හෝ ඉන් කිසියම් කොටසක පිටපත් ඉල්ලා සිටින්නේ නම්, අදාළ පිටපත් කිරීමේ ගාස්තු අය කර ගෙන ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ඇති කිරීමට ද ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

වෙනත් යම් රීතියක විධිවිධාන ඉක්මවා මේ රීති බලපවත්වන බව.

21. සභාවක අයවැය ලේඛනය සම්බන්ධයෙන් වෙනත් යම් රීතියක හෝ රීතිවල ඇතුළත් විධිවිධාන, මෙම රීතිවල ඇතුළත් විධිවිධානවලට පටහැණි වන අවස්ථාවක, එම විධිවිධාන අභිබවා මෙම රීතිවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

22. ඉහත සඳහන් රීතිවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්බන්ධයෙන් වන විට -

(අ) මෙම රීති ක්‍රියාත්මක වන දිනය වන තෙක්ම, 3 වන රීතිය යටතේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් පත් කර ගෙන නැතිනම්, එම කාරක සභාව පත් කර ගැනීම 2020 නොවැම්බර් 01 වන දිනයට පෙර සිදු කළ යුතු ය;

(ආ) මෙම රීති ක්‍රියාත්මක වන දිනය වන තෙක්ම, 5 (1) රීතිය යටතේ 2021 වර්ෂය සඳහා ආදායම් නියම කිරීමේ යෝජනාව සම්මත කර ගෙන නොමැති නම්, එහි සඳහන් "සැප්තැම්බර් මස 30" යන්න වෙනුවට, "නොවැම්බර් මස 30" වශයෙන් ද;

(ඇ) 6 (1) රීතියේ සංවර්ධන යෝජනා යොමු කරන ලෙස දැනුම් දීම නිවේදනය කිරීමට නියම කළ දිනය වන "මැයි මස 31" යන්න වෙනුවට, "නොවැම්බර් මස 10" දිනය වශයෙන් ද; සහ

(ඈ) 6 (1) රීතියේ සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වශයෙන් නියම කළ "ජූනි මස 30" දිනය වෙනුවට, "නොවැම්බර් මස 17" දිනය වශයෙන් ද;

අදාළ විය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම රීතිවල, - අර්ථ නිරූපනය.

"අනුප්‍රාප්තික සභාපතිවරයා" යන්නෙන්, 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 178අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් සභාපතිවරයා ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් පසුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ හෝ 66ළ වගන්තිය යටතේ, පුරප්පාඩු වී ඇති සභාපති ධූරයට පත් කරනු ලැබූ සභාපතිවරයා ද;

"අමාත්‍යවරයා" යන පදයට, පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වන අතර එම පළාතේ පළාත් සභාව විසුරුවා හැර ඇති යම් අවස්ථාවක ඊට එම පළාතේ ආණ්ඩුකාරවරයා ද ඇතුළත් විය යුතු ය;

"සභාව" යන්නෙන්, 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනත යටතේ වයඹ පළාත තුළ සංස්ථාපනය කරනු ලැබ ඇති නගර සභාවක් ද;

"ලේකම්වරයා" යන්නෙන්, 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ සභාවේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබූ තැනැත්තා ද:

අදහස් විය යුතු ය.

---

## පළාත් පාලන නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ වන මා විසින් සාදන ලද පහත සඳහන් රීති මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**රාජා කොල්ලුරේ,**
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
කුරුණෑගල දී ය.

### රීති

1. මෙම රීති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වන වගන්තිය අනුව සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු, ඊළඟ වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම, සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම, අයවැය යෝජනාව සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම මෙම රීතිවලින් නියම කර ඇති පටිපාටිය අනුව සිදු කළ යුතු ය. රීතිවල පටිපාටිය අනුගමනය කළ යුතු බව.

3. (1) සෑම වර්ෂයකම ජනවාරි මස මහා සභා රැස්වීමේ දී, ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවක් සඳහා සාමාජිකයන් පත්කර ගැනීම කළ යුතු අතර එහි සභාපති ධූරය, සභාවේ සභාපතිවරයා විසින් දැරිය යුතු ය. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව.

(2) මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව විසින් කලින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, ප්‍රාදේශීය සභාවක් විසින් මෙම රීතිවල විධිවිධාන අදාළ වන කිසිම කාරණයක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු ය.

ආදයම් හා වියදම් ඇස්තමේන්තු පිළිබඳ ප්‍රාරම්භක ක්‍රියා.

4. ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය කෙටුම්පත් කිරීමට අවශ්‍ය ආදායම් ප්‍රභව හඳුනා ගැනීම, සභාව සතු වත්කම් මෙහෙයවීම සඳහා වැය ප්‍රතිපාදන පුරෝකථනය සහ වෙනත් පුනරාවර්තන වියදම් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම සඳහා ප්‍රාරම්භක වැඩපිළිවෙළ යෙදීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

ආදයම් නියම කිරීමේ සහා යෝජනා සම්මත කිරීම සහ ආදයම් නියම කිරීමේ යෝජනා පිළිබඳ නිවේදන පළ කිරීම.

5. (1) ලේකම්වරයා විසින් සභාපතිවරයා විමසා, ඊළඟ වර්ෂය සඳහා සභාවට අය කර ගත යුතු හා අය කර ගත හැකි වරිපනම්, බදු, කුලී ආදායම් සහ සභාව විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අය කර ගත යුතු ගාස්තු නියම කිරීමේ සහා යෝජනා කෙටුම්පත් කර මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් ද සමග සැප්තැම්බර් මස 30 වන දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) සභාව විසින් සම්මත කරන ලද වරිපනම්, බදු, කුලී ආදායම් හා ගාස්තු නියම කිරීමට අදාළ යෝජනා පිළිබඳ නිවේදන, සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 01 වන දිනට පෙර *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

සංවර්ධන යෝජනා කැඳවීම හා ප්‍රමුඛතා ගත කිරීම.

6. (1) 2021 වර්ෂයට අදාල අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියෙන් පසුව එළඹෙන ඊළඟ වර්ෂයේ සිට ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා ජූනි මස 30 වන දිනට පෙර තමා වෙත ඉදිරිපත් කරන ලෙස පුවත් පත් මගින් පුරවැසියන් වෙත කෙරෙන නිවේදනයක් භාෂාත්‍රයෙන් සෑම වර්ෂයක ම මැයි මස 31 වන දිනට පෙර පළ කිරීමට සහ සෑම වර්ෂයක ම මැයි මස 31 දිනට පෙර පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී සභිකයන් වෙත නිවේදනය කිරීමට ද, ක්‍රියා කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(2) ඉහත (1) ඡේදය යටතේ සභාපතිවරයා වෙත ලැබී ඇති යෝජනා අතරින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් බලය ලැබී ඇති යෝජනා පමණක් තෝරා ගෙන එක් එක් කොට්ඨාසය අනුව වෙන් කර ඒවා ප්‍රමුඛතා ගත කොට සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සහ බැහැර කරනු ලබන යෝජනා වේ නම්, එසේ බැහැර කිරීමට පාදක වන හේතු පෙන්වා දෙමින් ඒ බව අදාළ පාර්ශවය වෙත දැනුම් දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

වියදම් ඇස්තමේන්තු කෙටුම්පත.

7. ඊළඟ වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් යෝජනා ද සමග පසුගිය වර්ෂ තුනක කාලය තුළ දරන ලද සත්‍ය වියදම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ලේකම්වරයා විසින් සභාපතිවරයා විමසා සහභාගීත්ව අයවැය පිළිබඳ සියළු උපාය මාර්ග අනුගමනය කරමින් ඊළඟ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ද ඇතුළත් කරමින් ඊළඟ වර්ෂයේ සභාවේ වියදම් ඇස්තමේන්තුව කෙටුම්පත් කළ යුතු ය.

ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත.

8. ලේකම්වරයා විසින් සභාපතිවරයා විමසා ඊළඟ වර්ෂය තුළ සභාවේ ආදායම් හා ලැබීම් ඇස්තමේන්තු කෙටුම්පත පිළියෙළ කළ යුතු ය.

ආදයම් හා වියදම් ඇස්තමේන්තුවට සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශය.

9. 7 වන රීතිය සහ 8 වන රීතිය යටතේ කෙටුම්පත් කරනු ලැබූ පිළිවෙළින් ඊළඟ වර්ෂයේ යෝජිත වියදම් ඇස්තමේන්තුව සහ යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තුව සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම සඳහා සභාපතිවරයා විසින් මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කිරීම.

10. (1) සෑම වර්ෂයක ම නොවැම්බර් මස 15 වන දිනට පෙර, සභාපතිවරයා විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් දිනයක දී ඊළඟ වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කර ගැනීම සඳහා සභාවේ සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක දී ඉදිරිපත් කළ යුතු ය.

(2) අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන එම රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් වැඩ කරන දින හතකට පෙර, එම කෙටුම්පත් අයවැය ලේඛනය -

(අ) එම රැස්වීමේ න්‍යාය පත්‍රය සමග සෑම සභිකයකු වෙත ම භාර දීමට; සහ

(ආ) පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට අවස්ථාව සලසා දෙනු ලබන බවට වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් පුවත් පත් දෙකක භාෂාත්‍රයෙන් ම පළ කිරීම,

සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) මෙම රීතිය යටතේ ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සලකා බැලීම සඳහා පවත්වනු ලබන මහා සභා රැස්වීමේ දී, සභාපතිවරයා විසින් ස්වකීය අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම රීතිවල විධිවිධාන යටතේ වූ කෙටුම්පත් අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා වන යෝජනාව මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) සභාපතිවරයා විසින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(5) සභාපතිවරයාගේ අයවැය යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව, අයවැය ලේඛනය සලකා බැලීම මෙම රීතිවල මින් මතු දැක්වෙන විධිවිධාන අනුව විය යුතු ය.

අයවැය ලේඛනය සඳහා වන සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම.

11. (1) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනයට, සභාවේ යම් සභිකයකු විසින් සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එකී සංශෝධන ස්වකීය අත්සනින් යුතු ව සංශෝධනයට පාදක වන හේතු ද සමග වැඩ කරන දින තුනකට පෙර ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

(2) ඉහත (1) ඡේදය යටතේ අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් වී නැතිනම්, ඒ බව සභාපතිවරයා විසින් එකී මහා සභා රැස්වීමේ දී නිවේදනය කළ යුතු අතර, අයවැය ලේඛනයට සංශෝධන ඉදිරිපත් කර ඇත්නම්, ඒවා ලැබී ඇති අනුපිළිවෙළ අනුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන රැස්වීම ආරම්භ කළ වහාම, එම සංශෝධන යෝජනා පිටපතක් බැගින් සෑම සභිකයකු වෙත ම ලබා දීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ ඊළඟ වර්ෂයේ අයවැය යෝජනාව වෙනත් සභිකයකු විසින් ස්ථිර කිරීමෙන් පසුව අයවැය ලේඛනයට සංශෝධන ඉදිරිපත් කර ඇති අනුපිළිවෙළ අනුව, අදාළ සභිකයා හෝ සභිකයන් විසින් එම සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) ලැබී ඇති අනුපිළිවෙළ අනුව අදාළ සභිකයා විසින් අයවැය ලේඛනයට ඉදිරිපත් කරන ලද සංශෝධන, සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව එම සංශෝධන තවත් සභිකයකු විසින් ස්ථිර කර ඇත්තේ නම් මිස ඒ පිළිබඳ ව සභාව විසින් කිසිදු කටයුත්තක් නොකළ යුතු ය.

(5) යම් සභිකයකු නමින් ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් සංශෝධනයක් වෙනත් සභිකයකු විසින් සභාවට ඉදිරිපත් නොකළ යුතු අතර එම සංශෝධනය සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ එම සංශෝධනය ගෙන ආ සභිකයා සභාව තුළ නොමැති විට, එම සංශෝධනය සභාවට ඉදිරිපත් වී නැති එකක් සේ සැලකිය යුතු ය.

(6) ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනයට අදාළ සංශෝධන සියල්ලම මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව, -

(අ) ඉදිරිපත් වී ඇති සංශෝධන සියල්ලට ම තමන් එකඟ වන්නේ නම්, ඒ බව; හෝ

(ආ) ඉදිරිපත් වී ඇති සංශෝධන අතරින් එක් සංශෝධනයකට හෝ සංශෝධන එකකට වැඩි ගණනකට තමන් එකඟ නොවන්නේ නම්, එසේ තමන් එකඟ නොවන සංශෝධන කවරේද යන්න සහ එසේ එකඟ නොවීමට පාදක කර ගත් හේතු කවරේද යන්න,

ලිඛිත ප්‍රකාශයක් සමග සභාවට දැනුම් දීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(7) අනතුරුව ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය සලකා බැලීම සඳහා 12 වන රීතියේ විධිවිධාන අනුගමනය කළ යුතු ය.

ආදායම් නියම කිරීමේ, අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය සඳහා ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම.

12. (1) මෙම රීති යටතේ සභාවට ඉදිරිපත් කරනු ලබන සෑම යෝජනාවක් ම සම්මත කිරීම සම්බන්ධයෙන් සභාව තීරණය කිරීමේ දී, ඊට අදාළ ඡන්ද විමසීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම පහත පටිපාටිය අනුව සිදු කළ යුතු ය.

(2) කිසියම් යෝජනාවක් සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කර ඇත්තේ නම් මිස, එකී කවර හෝ යෝජනාවක් පිළිබඳ ව සභාවේ දී සාකච්ඡාවට ගැනීම නොකළ යුතු අතර එකී යෝජනාව ස්ථිර කර ඇති විට ඒ පිළිබඳ විවාදයට අවස්ථාව ලබා දීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(3) එම යෝජනා පිළිබඳ ව සභාවේ විවාදය අවසන් කිරීමෙන් පසුව, ඒ බව සභාවට නිවේදනය කිරීම සහ එකී යෝජනාව සම්මත කිරීම පිළිබඳ ඡන්දය විමසන ලෙස ලේකම්වරයාට විධානය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) සභාවට ඉදිරිපත් කළ කිසියම් යෝජනාවකට පක්ෂ ව ඡන්දය දී ඇති, විපක්ෂ ව ඡන්දය දී ඇති, ඡන්දය දීමෙන් වැළකී සිටි හා ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භය තුළ නොසිටි සභිකයන් කවුරුන් ද යන්න සහ එදින රැස්වීමට පැමිණ සිටි සභිකයන් කවුරුන් ද යන්න හඳුනා ගත හැකි ආකාරයට එකී ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලය ඇතුළත් සටහනක්, ලේකම්වරයා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සභාපතිවරයා විසින් එම ප්‍රතිඵලය සභාවට නිවේදනය කළ යුතු ය.

(5) ඉහත (3) ඡේදයේ පරිදි කිසියම් යෝජනාවකට අදාළ ඡන්ද විමසීමක දී, එකී යෝජනාවට විපක්ෂ ව ඡන්දය ලබා දුන් සෑම සභිකයකු විසින් ම, තමන් එසේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි කරන ලිඛිත සන්නිවේදනයක් එම රැස්වීම පවත්වනු ලැබූ දින සිට දින හතක් ගත වීමට පෙර පළාත් පාලන කොමසාරිස්වරයාට ද පිටපතක් සහිත ව ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

(6) ඉහත (4) වන ඡේදයේ සඳහන් ඡන්ද විමසීමේ ප්‍රතිඵල සටහන සහ (5) ඡේදයේ සඳහන් සන්නිවේදනවල එක් පිටපතක් ද සමග ඊට අදාළ රැස්වීමේ වාර්තාවේ අගට අමුණා තැබීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

යම් අයවැය ලේඛනයක් සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කර ඇති විට අනුගමනය කළ යුතු පටිපාටිය.

13. (1) කිසියම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තියේ විධිවිධාන පරිදි එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය නැවත වරක් සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සම්මත කිරීම සඳහා වන යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට සභාපතිවරයා විසින් ක්‍රියා කළ යුතු අතර එම යෝජනාව තවත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු ය.

(2) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය දෙවන වර සලකා බැලීමේ අවස්ථාවේ දී ද, යම් සභිකයකුට සංශෝධන ඉදිරිපත් කළ හැකි අතර ඒ සඳහා පළමු වර ඉදිරිපත් කළ සංශෝධනවලින් බැහැර වූ සංශෝධන කිසිවක් ඉදිරිපත් කිරීමට හිමිකම් නොතිබිය යුතු ය.

(3) දෙවන වරට ඉදිරිපත් කරනු ලැබූ අයවැය සම්මත කිරීම සම්බන්ධයෙන් ද 12 වන රීතියේ පටිපාටිය අනුගමනය කළ යුතු ය.

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමට පෙර ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

14. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමට පෙර වූ යම් දිනයක දී, පළමු වරට සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 13 වන රීතිය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්තේනම්, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දින සිට සති දෙකක් ඉක්ම වූ වහාම, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ දී සම්මත වූ සේ සලකා ක්‍රියා කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය.

(2) ඉහත 1ඡේදය යටතේ කටයුතු කිරීමට සභාපතිවරයා විසින් තීරණය කරන ලද බව විගණකාධිපති, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන සහකාර කොමසාරිස්ට ද පිටපත් සහිත ව සෑම සභිකයකු වෙත ම ලිඛිත ව දැනුම් දීම සහ සභාවේ ඊළඟ රැස්වීමේ දී ඒ බව සභාවට නිවේදනය කිරීම ද සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

15. (1) කිසියම් සභාවක ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට වසර දෙකක් ගත වීමෙන් පසුව එළඹෙන යම් දිනයක දී සභාවට ඉදිරිපත් කළ යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් සම්මත කිරීම සභාව විසින් පළමු වරට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, 13 වන රීතිය යටතේ නැවත සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද, එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම්, මෙම රීතියේ මතු දැක්වෙන විධිවිධාන එහි දී අදාළ විය යුතු ය..

සභාවේ ධුර කාලය ආරම්භ වී වසර දෙකක් ගත වීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය.

(2) එම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබ ඇත්තේ -

(අ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට සංශෝධන කිසිවක් ඉදිරිපත් ව නොමැතිව තිබිය දී; හෝ

(ආ) එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ඉදිරිපත් කරන ලද සංශෝධනවලට සභාපතිවරයා එකඟ වී තිබෙන අවස්ථාවක දී,

වන විට, මෙහි (4) වන, (5) වන සහ (6) වන ඡේදවල පටිපාටිය අනුගමනය කළ යුතු අතර එම විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(3) සභිකයන් විසින් එම අයවැය ලේඛනයට හෝ පරිපූරක අයවැය ලේඛනයට ගෙන එන ලද සංශෝධන එකකට හෝ කිහිපයකට සභාපතිවරයා එකඟ වී නැති විටක, සභාව විසින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ නම්, එහි දී ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) ඉහත (2) වන ඡේදයේ දැක්වෙන කවර හෝ ආකාරයකින් එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක -

(අ) මෙම රීතිවල නියම යටතේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධ ප්‍රාරම්භක ක්‍රියාකාරකම් සිදු කර තිබේ ද නැති ද යන බව ලේකම්වරයා විසින් තහවුරු කරනු ලැබූ වාර්තාවක්;

(ආ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලන අවස්ථාවට සභිකයන් විසින් සභාවට ඉදිරිපත් කර ඇති සංශෝධන අතරින් සභාපතිවරයා එකඟ නොවූ සංශෝධනවල පිටපත් හා සභාපතිවරයා එසේ එකඟ නොවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද හේතු පැහැදිලි කරනු ලැබූ ලිඛිත ප්‍රකාශවල පිටපත්;

(ඇ) එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී, 12 වන රීතිය යටතේ සභිකයන් විසින් ඡන්දය ප්‍රකාශ කළ ආකාරය සටහන් කළ ලේඛනයේ පිටපතක් බැගින්; සහ

(ඈ) අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය පළමු වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ දෙවන වරට ඉදිරිපත් කළ අවස්ථාවේ දී විපක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ යම් සභිකයකු විසින් 12 (5) රීතිය යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇති ලිඛිත සන්නිවේදනවල පිටපතක් බැගින්,

සභාපතිවරයා විසින් ලේකම්වරයාගේ සහතිකයක් ද සමඟ හැකි පහසු ඉක්මනින් පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කළ යුතු ය.

(5) සභාපතිවරයාගේ ඉහත කී වාර්තාව සැලකිල්ලට ගනිමින්, අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්මත කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව පළාත් පාලන කොමසාරිස්වරයා විසින්, එකී වාර්තාව තමන් වෙත ලැබී දින තුනක් ඇතුළත ස්වකීය නිරීක්ෂණ හා නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) ඉහත (5) වන ඡේදය යටතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් එකී වාර්තාව ලැබුණු දින සිට දින හතක් ඇතුළත එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය යථා පරිදි සභාවේ සම්මත කරන ලද අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් වන්නේ ද නැති ද යන්න, ඊට හේතු පැහැදිලි කරන ලිඛිත ප්‍රකාශයක් ද සහිත ව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයාගේ එකී තීරණය ;

(අ) පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණකාධිපතිට, පළාත් පාලන කොමසාරිස්ට, පළාත් පාලන සහකාර කොමසාරිස්ට සහ ලේකම්වරයාට ද පිටපත් සහිත ව වහාම සභාපතිවරයා වෙත දැන්විය යුතු ය.

(ආ) ලේකම්වරයා විසින් හැකි පහසු ඉක්මණින් සභාවේ සභිකයන් වෙත දන්වා යැවිය යුතු ය.

(7) එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඉහත (6) ඡේදය යටතේ -

(අ) යථා පරිදි සම්මත වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, වෙනත් පටහැණි කිසියම් හේතුවක් නොවන්නේ නම් මිස, එකී අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය වලංගු එකක් ලෙස සැලකිය යුතුවාත් හැර එකී සභාපතිවරයාට තවදුරටත් ස්වකීය සභාපති ධුරයේ කටයුතු කරනු ලැබිය හැකි අතර එකී තීරණය සභාපතිවරයා විසින් සභාවේ ඊළඟ රැස්වීමේ දී සභාවට වාර්තා කළ යුතු ය.

(ආ) ප්‍රතික්ෂේප වූ එකක් වශයෙන් සැලකිය යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ දෙවන වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලැබිය යුතු ය.

(8) ඉහත (3) සහ (7) (ආ) ඡේද යටතේ සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලබන අවස්ථාවක, එම සභාවේ සභාපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

අනුප්‍රාප්තික සභාපතිවරයා අයවැය ලේඛනය ඉදිරිපත් කළ යුතු බව සහ සභාව විසුරුවා හැර ඇති සේ සලකනු ලබන අවස්ථාව.

16. (1) 15 වන රීතිය යටතේ සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් අනතුරුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ එම සභාපති ධුරයේ පුරප්පාඩුව සඳහා පත් කරනු ලැබූ අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් හැකිතාක් ඉක්මණින් ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සලකා බැලීම සඳහා කැඳවනු ලබන රැස්වීමක් දී සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ආකාරයෙන් ම, එකී වර්ෂයෙන් පසුව එළඹෙන සෑම වර්ෂයක් ම සඳහා වන අයවැය ලේඛන සහ අවශ්‍ය වන්නේ නම් පරිපූරක අයවැය ලේඛන සම්මත කර ගැනීම සඳහා ක්‍රියා කිරීම ද අනුප්‍රාප්තික සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(3) අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් අයවැය ලේඛන හෝ පරිපූරක අයවැය ලේඛන සභාවට ඉදිරිපත් කිරීමේ දී, අයවැය ලේඛනය සම්මත කිරීමේ දී සහ ප්‍රතික්ෂේප කිරීමේ දී ද මෙම රීතිවල ඉහත සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

(4) ඉහත (3) ඡේදයේ කුමක් සඳහන් වුව ද, අනුප්‍රාප්තික සභාපතිවරයා විසින් සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් පළමු වරට සභාවට ඉදිරිපත් කර එම අවස්ථාවේ දී ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, නැවත සලකා බැලීම සඳහා දෙවන වරට සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ද ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ නම්, එසේ දෙවන

වරට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට සති දෙකක කාලය අවසන් වීමෙන් පසු ව එළඹෙන දිනයේ සිට සභාව විසුරුවා හරිනු ලබන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(5) ඉහත පරිදි සභාව විසුරුවා හරින ලද සේ සලකනු ලැබ ඇති විට, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාර සහ, අවස්ථාවෝචිත පරිදි පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් සභාවේ ඉතිරි කාල සීමාව සඳහා විශේෂ කොමසාරිස්වරයකු ලෙස ධූර දරන විශේෂ කොමසාරිස්වරයකු පත් කළ යුතුය.

17. ඉහත 16 වන රීතිය යටතේ සභාව විසුරුවා හැර ඇති ලෙස සලකනු ලැබීමෙන් පසුව, එම සභාවට පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා විසින් ඊළඟ වර්ෂයේ සහ ඉන් අනතුරුව එළඹෙන වර්ෂ සඳහා වන අයවැය ලේඛන සහ අවස්ථාවෝචිත පරිදි පරිපූරක අයවැය ලේඛන පිළියෙළ කිරීම හා සම්මත කිරීම පිළිබඳ තීරණ ගනු ලැබිය යුතු ය.

*සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක අයවැය සම්මත කිරීම.*

18. (1) කිසියම් සභාවක අයවැය අදාළ වර්ෂය ආරම්භ වීමට පෙර සම්මත කිරීමට නොහැකි වුව ද, එම වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්මත කර ගනු ලබන තෙක්, 10 වන රීතිය යටතේ සභාව වෙත ඉදිරිපත් කර ඇති යෝජිත වියදම් පිළිබඳ ඇස්තමේන්තුවෙහි ඇතුළත් පුනරාවර්තන වියදම් සඳහා මුදල් වැය කිරීමට බාධාවක් නොවිය යුතු ය.

(2) එසේ වුව ද, අදාළ වර්ෂයේ අයවැය ලේඛනය සම්මත වී ඇති සේ සැලකීමට හැකියාව ලැබෙන තෙක් කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීම නොකළ යුතු ය.

*මුදල් වර්ෂය ආරම්භ වන තෙක් අයවැය සම්මත නොවුන අවස්ථාවක මුදල් වියදම් කිරීම.*

19. අවශ්‍ය යයි සභාපතිවරයා විසින් අදහස් කරනු ලබන කවර අවස්ථාවක වුව ද, පරිපූරක අයවැය ලේඛනයක් පිළියෙළ කර සභාවට ඉදිරිපත් කළ හැකි අතර, එහි දී ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තියේ විධිවිධාන සහ මෙම රීතිවල 7 වන රීතියේ සිට 17 වන රීතිය දක්වා (එම රීති දෙක ද ඇතුළත් ව) වන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

*පරිපූරක අයවැය ලේඛනය.*

20. (1) සභාව අනුමත කරනු ලැබූ සෑම අයවැය ලේඛනයක ම සහ පරිපූරක අයවැය ලේඛනයක ම ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් සභාවේ ප්‍රධාන කාර්යාලයයේ, සෑම උප කාර්යාලයක ම සහ සෑම මහජන පුස්තකාලයකම, ගාස්තු ගෙවීමකින් තොරව මහජනයා විසින් පරිශීලනය කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට ද සහ සභාවේ අන්තර්ජාල වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් එහි ද ඒවායේ පිටපත් ඇතුළත් කිරීමට ද ලේකම්වරයා විසින් ක්‍රියා කළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ඒ යම් ලේඛනයක සම්පූර්ණ පිටපතක් හෝ ඉන් කිසියම් කොටසක පිටපත් ඉල්ලා සිටින්නේ නම්, අදාළ පිටපත් කිරීමේ ගාස්තු අය කර ගෙන ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ඇති කිරීමට ද ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

*සම්මත කරනු ලැබූ අයවැය ලේඛනය සහ පරපූරක අයවැය ලේඛනය මහජනතාවගේ පරිශීලනය සඳහා තබා තිබිය යුතු බව.*

21. සභාවක අයවැය ලේඛනය සම්බන්ධයෙන් වෙනත් යම් රීතියක හෝ රීතිවල ඇතුළත් විධිවිධාන, මෙම රීතිවල ඇතුළත් විධිවිධානවලට පටහැණි වන අවස්ථාවක, එම විධිවිධාන අභිබවා මෙම රීතිවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

*වෙනත් යම් රීතියක විධිවිධාන ඉක්මවා මේ රීති. බලපවත්වන බව*

22. ඉහත සඳහන් රීතිවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සම්බන්ධයෙන් වන විට -

*අන්තර්කාලීන විධිවිධාන.*

(අ) මෙම රීති ක්‍රියාත්මක වන දිනය වන තෙක්ම, 3 වන රීතිය යටතේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවක් පත් කර ගෙන නැතිනම්, එම කාරක සභාව පත් කර ගැනීම 2020 නොවැම්බර් 15 වන දිනයට පෙර සිදු කළ යුතු ය;

(ආ) මෙම රීති ක්‍රියාත්මක වන දිනය වන තෙක්ම, 5 (1) රීතිය යටතේ 2021 වර්ෂය සඳහා ආදායම් නියම කිරීමේ යෝජනාව සම්මත කර ගෙන නොමැති නම්, එහි සඳහන් "සැප්තැම්බර් මස 30" යන්න වෙනුවට, "නොවැම්බර් මස 30" වශයෙන් ද;

(ඇ) 6 (1) රීතියේ සංවර්ධන යෝජනා යොමු කරන ලෙස දැනුම් දීම නිවේදනය කිරීමට නියම කළ දිනය වන "මැයි මස 31" යන්න වෙනුවට, "නොවැම්බර් මස 10" දිනය වශයෙන් ද; සහ

(ඇ) 6 (1) රීතියේ සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වශයෙන් නියම කළ "ජුනි මස 30" දිනය වෙනුවට, "නොවැම්බර් මස 17" දිනය වශයෙන් ද;

අදාළ විය යුතු ය.

අර්ථ නිරූපනය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම රීතිවල, -

"අනුප්‍රාප්තික සභාපතිවරයා" යන්නෙන්, ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් සභාපතිවරයා ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබීමෙන් පසුව, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ හෝ 66ඉ වගන්තිය යටතේ, පුරප්පාඩු වී ඇති සභාපති ධුරයට පත් කරනු ලැබූ සභාපතිවරයා ද;

"අමාත්‍යවරයා" යන පදයට, පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වන අතර එම පළාතේ පළාත් සභාව විසුරුවා හැර ඇති යම් අවස්ථාවක ඊට එම පළාතේ ආණ්ඩුකාරවරයා ද ඇතුළත් විය යුතු ය;

"සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වයඹ පළාත තුළ සංස්ථාපනය කරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවක් ද;

"ලේකම්වරයා" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තිය යටතේ සභාවේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබූ තැනැත්තා දඃ

අදහස් විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.